**ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 21 වන දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදය යටතේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරනු ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්**,** ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් වත්කම් ගිණුම් ශේෂ හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ අතර රු.120,103,440 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, ඒ හැර මූල්‍ය ප්‍රකාශ ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඒසීඒ-6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ 2020 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දක්වා කාලසීමාවට අදාළව වත්කම්වල ශුද්ධ අගය රු.52,697,670 ක අඩුවීමක් පෙන්නුම් කළද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සන්සන්දනාත්මක තොරතුරු අනුව දේපල, පිරියත උපකරණවල රු.66,676,324 කින් වැඩි වී තිබුණි. | ආරම්භක ශේෂය ලෙස ඇතුළත් කළ මූල්‍ය නොවන වත්කම් නිවැරදි වත්කම් කාණ්ඩ වලට ඇතුළත් නොවී තිබීම හේතුවෙන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වාහන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන්ද ගිණුම්ගත කර ඇත. එය නිවැරදි කිරීමේ දී වත්කම්වල අගය අඩුවීම් පෙන්නුම් කළ ද 2020 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂ ලෙස මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම නිසා අගය වැඩිවීමක් පෙන්නුම් කර ඇති බව. | වෙනසට හේතු හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | විගණනයට ඉදිරිපත් කරන ලද ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු වාර්තා අනුව, ඉඩම් ගොඩනැගිලි වටිනාකම රු.2,043,782,125 ක් වුවද, ඒසීඒ-6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ රු.2,117,877,419 ක් ලෙස දක්වා ගිණුම්ගත කිරීමට කටයුතු කිරීමෙන් රු.74,095,294 ක වෙනසක් පැවතුණි, තවද වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.අ | පරීක්ෂාකර පිළිතුරු ඉදිරිපත් කරන බව. | වෙනසට හේතු හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතු අතර වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වත්කම් තක්සේරු කරගත යුතු වීම. |
| (ඇ) | විගණනයට ඉදිරිපත් වූ වාහන උප ලේඛනයේ සඳහන් වටිනාකම රු.108,333,929 ක් වූ අතර,ඒසීඒ-6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් වටිනාකම රු.113,158,429 ක් වූයෙන් රු.4,824,500 ක වෙනසක් පැවතුණි. | පරීක්ෂා කර පිළිතුරු ඉදිරිපත් කරන බව. | වෙනසට හේතු හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතු වීම. |

**1.6.2 විගණන සාක්ෂි නොවීම**

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ACA-6 මුල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ 2019 දෙසැම්බර් 31 දිනට දක්වා තිබූ ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයක් ලෙස සටහන් කිරීමේදී වත්කම් කේත 10 ක රු.120,103,440 ක වෙනසක් පැවති අතර, එම ආරම්භක ශේෂ ගැලපීම්වලට අදාලව සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | කාර්යාල සතු ආරම්භක වත්කම් ගිණුම්ගත කිරීම් සියල්ලම පසුගිය වර්ෂවල අවසන්කර නොතිබූ බැවින් එසේ ඇතුළත් නොකළ වත්කම් 2020 වර්ෂය තුළදී ද ආරම්භක ශේෂ ලෙස ගිණුම්ගත කර ඇත. එසේම 2020 වර්ෂය තුළදී ඉදිකරන ලද ගණකාධිකාරී නිල නිවාසයේ වියදම් ගිණුම්ගත කිරීමේදී නව වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු වුව ද රු.4,323,521ක් වටිනා කොටස් ගෙවීම් සිගාස් වැඩසටහනේ වත්කම් ගිණුම් ගත කිරීමේදී නිලධාරීන්ගේ නොදැනුවත් භාවයෙන් අගය එකතු කිරීම ලෙස ගිණුම්ගත කර ඇත. එම නිසා එම වටිනාකම ආරම්භක ශේෂයට ඇතුළත් වී ඇති බවත් ශේෂ අතර වෙනස්කම සිදු වී ඇති බවත්,මින් ඉදිරියට ආරම්භක ශේෂයන් ඇතුළත් කරන්නේ නම් අදාළ ජර්නල් සටහන්වල පිටපත් ලබාදීමට දැනුවත් කර ඇති බව. | වැරදි නිවැරදි කිරීමේදී ඒ සඳහා අනුමත කළ ජර්නල් පිටපත් විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් දැරීම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබී තිබූ ප්‍රතිපාදන වලින් සියයට 3 සිට සියයට 68 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි. | කොවිඩ් තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති ඉටුකළ නොහැකි විය. | ලැබෙන ප්‍රතිපාදන උපරිම මට්ටමෙන් උපයෝජනය කළ යුතු වීම. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVII වැනි පරිච්ඡේදයේ 13.2 වගන්තිය | | සෑම මූලික විමර්ශනයක්ම නොපමාව නිම කිරීම සඳහා අදාළ සෑම පාර්ශවයක්ම වග බලා ගතයුතු වුවද, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවස්ථා 2 කදී එසේ කටයුතු කර නොතිබුණි. | මූලික විමර්ශන කටයුතු සඳහා පත් කරනු ලැබූ නිලධාරීන් වරින් වර මාරුවීම නිසා වාර්තාව යැවීම ප්‍රමාද වී ඇති බව. | සෑම මූලික විමර්ශනයක්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව නොපමාව නිම කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | | (i) මුදල් රෙගුලාසි 138, 245 | වලපනේ,හඟුරන්කෙත සහ නුවරඑළිය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව වටිනාකම රු.25,190,404 ක් වූ වවුචර් 30 ක් සඳහා සහතික කිරීමෙන් තොරව ගෙවීම් කර තිබුණි. | කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් නිලධාරීන් අඛණ්ඩව සේවයට වාර්තා නොකිරීම නිසා අතපසු වීමකින් වවුචර් සහතික කිරීමට නොහැකි වූ බව හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දන්වා ඇති බව. | මුදල් රෙගුලාසි 138 හා 245 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | | (ii) මුදල් රෙගුලාසි 206 | තැන්පතුවකින් මුදල් ආපසු ගෙවීමේ අවස්ථා 6 කදී වවුචර් නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කර නොතිබුණි. | මේ වනවිට ගෙවීම් කිරීමේදී නිලධාරීන් දෙදෙනෙකු සහතික කරන බව | මුදල් රෙගුලාසි 206 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින වටිනාකම රු.900,878 ක අග්‍රිම ශේෂයක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2012 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවකු වෙත ගෙවන ලද අත්තිකාරමක් අය නොවීම නිසා මෙම තත්වය ඇති වී ඇති බවත් 2018 වර්ෂයේ ලබාගත් කැබිනට් තීරණයක් අනුව ඉදිරි කටයුතු සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බව. | නොපියවූ අත්තිකාරම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2.4 තැන්පතු ශේෂයන්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 වර්ෂය තුළ නිම නොකළ ව්‍යාපෘති වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා එක් එක් ව්‍යාපෘති වටිනාකමින් සියයට 40 හෝ සියයට 30 බැගින් රු.68,038,199 ක් මුදල් රෙගුලාසි 215 (3) හි විධිවිධානයන්ගේ බැහැරව අංක 6000/0/0/16/0/16 දරණ පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණි. | 2020 දෙසැම්බර් මස අවසානයේදී කොන්ක්‍රීට් කර අවසන් වූ මාර්ගවල දෙසැම්බර් 31 දිනට ප්‍රථම හැමර් ටෙස්ට් පරීක්ෂණ වාර්තා ලබා ගැනීම ගැටළු සහගත වූ බැවින් මාර්ගවල සනකම පිළිබද පරීක්ෂාවන් සියල්ල සිදුකර ගෙවීම් කිරීම සඳහා ව්‍යාපෘතියේ වටිනාකමින් සියයට 30 ක අමතර රුඳවුම් මුදලක් තබාගත් බව. | මුදල් රෙගුලාසි 215(3) අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) තැන්පත් කළ දින සිට වර්ෂ 10 ක් ඉක්ම වූ එකතුව රු.8,831,545 ක් වූ ඉඩම් තැන්පතු ශේෂ 14 ක් නිරවුල් කිරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වන්දි පරීක්ෂණ කටයුතු අවසන් වන තෙක් මුදල් රඳවාගෙන ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පතු නිරවුල් කළ යුතු වීම |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 34 ක්‍රේටන් විලේජ් නිල නිවස අලුත්වැඩියා කිරීම සඳහා රු.720,849 ක් වූ ඇස්තමේන්තුගත මුදල රු.747,768 ලෙස සංශෝධනය කර තිබුණි. තීන්ත ආලේපනය, කොන්ක්‍රීට් තට්ටු මඟින් ජලය කාන්දු වීම සහ නිමාව දුර්වල මට්ටමක පැවතීම යන අඩුපාඩු පැවතියදී සමිතිය වෙත රු.715,437 ක් ගෙවීම් කර තිබුණි. | රඳවුම් මුදල් නිදහස් කිරීමට ප්‍රථම අඩුපාඩු නිවැරදි කරන ලෙස කොන්ත්‍රාත්කරුට දන්වා ඇති බව. | අවසන් බිල්පත සඳහා ගෙවීම් කිරීමට පෙර අදාළ කර්මාන්තයේ නිමාව පිළිබඳ සහතිකයක් ලබාගත යුතු අතර අඩුපාඩු නිවැරදි කරවා ගත යුතු වීම. |
| (ආ) | මුදල් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද සපිරි ගමක් වැඩසටහනේ ප්‍රතිපාදන යටතේ රු.496,947 ක නිමි වැඩ වටිනාකමක් සහිත මවුන්ට් වර්නන් මැද කොටස සඳහා ජලය සැපයීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ක්‍රීට් නළ යෙදීම, සියලු උපාංගයන් සහිතව PVC ජල නළ එළීම හා විදුලිය සැපයීම වශයෙන් වූ කාර්යයන් ඇතුළත් කර එක් ව්‍යාපෘතියක් වශයෙන් සැලැසුම් කර තිබුණි. එහෙත් භෞතික පරීක්ෂාවේදී විදුලිය සැපයීම එක් ව්‍යාපෘතියක් ලෙසත් ඇස්තමේන්තුවේ ඇතුළත් අනෙකුත් කාර්යයන් වෙනත් ව්‍යාපෘතියක් ලෙසත් ඉටුකර තිබුණි.කොන්ක්‍රීට් නළ යෙදීම හා PVC ජල නළ එළීම සිදු කිරීම සඳහා රු.296,947 ක පිරිවැයක් දරා තිබුණද, 2021 පෙබරවාරි 19 වන දින වන විටත් ජලය සැපයීමේ කාර්යය ඉටුකර නොතිබුණි.<br>ව්‍යාපෘතියේ වෙනමම කාර්යයක් ලෙස විදුලිය ලබාගැනීම සඳහා රු.200,000 ක මුදලක් අදාළ කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද, ඒ සඳහා ඉදිරිපත් කර තිබුණු බිල්පතෙහි මුදල් ගෙවන පාර්ශවයේ නම "කළමනාකරු" වශයෙන් සඳහන් කර තිබුණු අතර, මෙම මුදල ව්‍යාපෘතියට අදාළ කාර්යය සඳහා කොන්ත්‍රාත්කරු විසින් ම දරන ලද පිරිවැයක්ද යන්න තහවුරු කරවා ගැනීමකින් තොරව අදාළ සමිතියට ගෙවා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | කඩිනමින් ජල සම්බන්ධතාවය ලබාදීමට කටයුතු කළ යුතු වීම.<br>විදුලිබල මණ්ඩලයෙන් ලබාදුන් ඇස්තමේන්තු සහ මුදල් ගෙවීමේදී ලැබුණු ලදුපත් විගණනයට ඉදිරිපත් කළ යුතු විම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ රු.3,000,000 ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කළ රම්බොඩ ඉහළ කඩවීදිය අවදානම් ගල් ඉවත් කිරීමේ ව්‍යාපෘතියේ ගල් 148.2 $m^3$ ක් කඩා ඉවත් කිරීමට රු.1,940,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි. ගල් කඩා දමා තිබුණද, අවදානම පහව යන ලෙස ඉවත් නොකළ ගල් පැවතුණි. මෙම ගල් එකිනෙක පුපුරා පැලීම්වලට ලක්ව් තිබුණි.ඉහළින් ගල් පෙරළීමෙන් සිදුවන අවධානම වළක්වා ගැනීම සඳහා රැඳවුම් කානුවක් බැවුම හරස් අතට යෙදීමෙන් ඒ තුළ ජලය රැස් නොවන සේ පවත්වා ගත යුතු අතර කානුවට පිටතින් රැඳවුම් කණ්ඩියක් ඉදිකිරීමට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් නිර්දේශ ලබාදී තිබුණද එම කාර්යයන් කිසිවක් මෙහිදි ඇස්තමේන්තුව තුළ ඇතුළත්ව නොතිබුණි. | ලැබුණු ප්‍රතිපාදන සීමාව තුළ අවදානම අවම කිරීමට අනිවාර්යයෙන් සිදුකළ යුතු කොටස් ඇතුළත් කර ඇස්තමේන්තු සකස් කර ඇති අතර, ඉතිරිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලීම් කර ඇති බව. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සපිරි ගමක් වැඩසටහනේ ප්‍රතිපාදන යටතේ රන්වන්තලාව ඇළ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.481,643 ක මුදලක් රන්වන්තලාව ගැමුණු ගොවි සංවිධානය වෙත ගෙවීම් කර තිබුණි. අදාළ මාර්ගයේ ජලය වගා බිම් පෙදෙස වෙත රැගෙන ඒමට තවත් 100 m ක පමණ දුරක් ඇළ මාර්ගය සකස් කළ යුතුව තිබුණි. දැනට ජලනළ එළා ලබාගන්නා ජලය වගාබිම් කරා පැමිණීමට ප්‍රථම පොළොව තුළට උරාගන්නා බැවින්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළද අක්කර 25 කට වැඩි ගොවි බිම් ප්‍රමාණයක් මේ වන විටත් වැසි ජලයෙන් වගා කටයුතු ඉටු කරමින් පැවතුණි. | ලැබී ඇති ප්‍රතිපාදනවලට ප්‍රමාණයට වැඩ ඉටු කර ඇති බව. | ව්‍යාපෘති සැලැසුම් කිරීමේදී ඵලදායිතාවය පිළිබඳව සැළකිලිමත් වියයුතු අතර ඇළ මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සපිරි ගමක් වැඩසටහනේ ප්‍රතිපාදන යටතේ ඉදිකර තිබුණු විදුලිපුර දකුණ පුස්තකාල ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානය සඳහා ඇලුමිනියම් දොර සහ ජනෙල් සියලු උපාංගයන් සහිතව සපයා සවි කිරීම සඳහා රු.453,334 ක් ඇස්තමේන්තුවට ඇතුළත් කර තිබුණද, | සම්පූර්ණ වැඩ කොටස් නිම කිරීමට 2020 වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් ඇළුමිනියම් දොර ජනෙල් වැඩ 2021 වර්ෂයේ නිම කර අපේක්ෂිත කාර්යය සඳහා ගොඩනැගිල්ල යොදා | 2021 වර්ෂයේදී ප්‍රමුඛතාවය මත ප්‍රතිපාදන සලසාගෙන වැඩ නිම කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | පසුව එය දෙවන අදියර වශයෙන් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. මේ හේතුවෙන් එම කාර්යයන් ඉටුකරන තෙක් අදාළ ගොඩනැගිල්ල නිෂ්කාර්යයව පැවතුණි. | ගැනීමට කටයුතු කරන බව. | |
| (ඇ) | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බීජ බෝංචි වගා කරන ගොවින්ගේ ආදායම ඉහළ නැංවීමේ අරමුණින් ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ අතර, 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය වෙනුවෙන් රජයෙන් රු.5,311,908 ක මුදලක් දරා තිබුණි.බීජ බෝංචි ශීත ගබඩා පහසුකම් ලබාදීම සඳහා මන්දාරම්නුවර ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමියේ ඉකුත් වර්ෂයේ ඉදිකිරීම් නිම කරන ලද ශීත ගබඩාව 2021 ජනවාරි 11 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | ඉදිරියේදී ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන බව. | ව්‍යාපෘති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වීම. |
| (ඈ) | ගම්පෙරලිය වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයේ ආගමික ස්ථාන 85 ක් වෙත සූර්ය බලශක්ති පද්ධති මඟින් විදුලි උත්පාදනය සඳහා 2020 වර්ෂයේ රු.42,500,000 ක් වැය කර තිබුණද විගණිත 2021 මාර්තු 30 දින වන විටත් එම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. | ඉක්මනින්ම ජාතික විදුලි පද්ධතිය හා සම්බන්ධ කිරීමට කටයුතු කරන ලෙසට විදුලි බල මණ්ඩලයට දන්වා ඇති බව. | සැලැසුම් කළ ව්‍යාපෘති ලබාදෙන ප්‍රතිපාදන මත උපරිම මහජන සේවයක් සැලසෙන පරිදි අනුමත ව්‍යාපෘති යෝජනාවේ සඳහන් පරිදි ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සපිරි ගමක් වැඩසටහනේ ප්‍රතිපාදන යටතේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හරස්බැද්ද අංක 03 මාර්ගය සංවර්ධනය කිරීමට අදාළව රු.1,980,000 කට ගිවිසුම්ගත වුවද, කොන්ත්‍රාත් සමිතිය විසින් වැඩ නිමකර තිබුණේ රු.905,013 ක් හෙවත් ඇස්තමේන්තු වටිනාකමින් සියයට 45 ක් පමණි. | ඉටුකළ වැඩ ප්‍රමාණයට පමණක් ගෙවා ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් අදාළ සමිතිවලට එරෙහිව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට සහ ගිවිසුමට අනුව කටයුතු කළ යුතු වීම. |

**3.4** **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

-----------------------------------

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙළ කළ යුතුව තිබුණි.ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 හි 03 ඡේදයේ උපදෙස් වලින් බැහැරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉලක්කගත කාර්යයන් ඒකාබද්ධ කරමින් දිස්ත්‍රික්කය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම වෙනුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉලක්ක පමණක් ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. | පෙන්වා දී ඇති අඩුපාඩු ඉදිරියේදී ඇති නොවන ආකාරයට සැලසුම් සකස් කරන ලෙසට නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව. | කාර්යසාධන වාර්තාව චක්‍රලේඛ උපදෙස් පරිදි ඵලදායී හා වඩාත් නිවැරදි ලෙස පිළියෙල කළ යුතු වීම. |
| (ආ) පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි 2020 වර්ෂය තුළ ආයතන සහ ගිණුම් අංශවල ඉටුකිරිමට අපේක්ෂිත ඉලක්කයන්, හඳුනාගත් සේවාවන් සඳහා පිහිටුවාගත් වාර්ෂික ඉලක්කයන් සහ කාර්ය මණ්ඩල පුහුණු ඉලක්කයන් පිළිබඳ තොරතුරක් ඉදිරිපත් කර ඇතුළත් කර නොතිබුණි. | -එම- | ක්‍රියාකාරී සැලැස්ම වඩාත් නිවැරදි ලෙස පිළියෙල කළ යුතු වීම . |
| (ඇ) 2020 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ කාර්යසාධන වාර්තාවෙහි ප්‍රගතිය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ඉලක්කගත කාර්යයන්ට අනුකූලව පිළියෙල කර නොතිබීම හේතුවෙන් ඇතැම් අංශවල ක්‍රියාකාරී සැලැස්මෙහි කාර්යයන්ට අදාල ප්‍රගතිය කාර්ය සාධන වාර්තාව තුළින් හඳුනාගත නොහැකි විය. | -එම- | චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වීම |

**3.5** **ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලේඛනය අනුව, 2020 වර්ෂය සඳහා ක්‍රීඩා භාණ්ඩ සැපයුම් කිරීම වෙනුවෙන් ආයතන 13 ක් ලියාපදිංචි වී තිබුණි. ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම සඳහා 2020 ජුනි 03 දින සිදුකර තිබූ මිල ගණන් කැඳවීමේ ලිපිය අනුව ලියාපදිංචි වී තිබූ කිසිදු සැපයුම්කරුවෙකු වෙත මිල කැඳවීම් ලිපි යවා නොතිබුණි. | විශේෂිත වර්ගයේ මිලදී ගැනීම් නිසා අදාළ උපකරණ තිබෙන ස්ථාන පරීක්ෂා කර එම ආයතනවලින් මිල ගණන් කැඳවීමට කටයුතු කර ඇති බව. | ලියා පදිංචි සැපයුම්කරුවන් ගෙන් මිල ගණන් කැඳවිය යුතු වීම. |
| (ආ) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී කාර්යාලවලට ප්ලාස්ටික් පුටු ලබාගැනීමේ ප්‍රසම්පාදනයේදී ඒ සඳහා අවශ්‍ය පිරිවිතර හෝ පුටු සංඛ්‍යාව සඳහන් නොකර මිල ගණන් කැඳවා පුටු 410 ක් ලබා ගැනීම වෙනුවෙන් රු.704,938 ක් ගෙවා තිබුණි. | ඉදිරියේදි අඩුපාඩු වළක්වා ගැනීමට කටයුතු කර ඇති බව. | මිලදී ගැනීම් සිදු කිරීමේදි රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු වීම. |

**3.6** **අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සපිරි ගමක් වැඩසටහනේ ප්‍රතිපාදන යටතේ රජ ඇළ වසමේ ඉදිකර ඇති පැරණි ඇළ මාර්ගයේ උස 1' වූ අතර, පළල 1' 6" විය. නමුත් එම ඇළ මාර්ගයේ සිට පැමිණෙන ජලය මාවෙල නැගෙනහිර වසම වෙත ගෙන යෑම සඳහා සකස් කර ඇති ඇළ මාර්ගයේ උස 3' වූ අතර, පළල 2' 6" විය. 1' උස ඇළ මාර්ගයකින් පැමිණෙන ජලය රැගෙන යෑමට 3 ' ඇළක් සකස් කිරීම කිසිසේත් ප්‍රායෝගික නොවූවක් බැවින් ඒ සඳහා රු.716,530 ක අනාර්ථික පිරිවැයක් දරා තිබුණි. | පිළිතුර ලබාදී නොමැත. | සුදුසුකම් ලත් ඉංජිනේරුවරයෙකු ලවා ඉදිකිරීම් අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතු වීම |

## 3.7 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | -------------------------- | ------------ |
| (අ) | 2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ විධිවිධානයන්ගෙන් බැහැරව විශ්‍රාමිකයන් මිය ගිය අවස්ථා 14 කදී ග්‍රාම නිලධාරීන් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කර නොතිබුණි. ග්‍රාම නිලධාරීන්ගේ නොසැළකිලිමත් භාවය හේතුවෙන් කොත්මලේ හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එකතුව රු.2,173,548 ක මුදලක් මිය ගිය විශ්‍රාමිකයන්ගේ ගිණුම්වලටබැර කර තිබූ අතර 2021 ජනවාරි 20 දින වන විටත් ඉන් එකතුව රු.438,833 ක් අයවිය යුතුව පැවතුණි. | වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනිමින් බවතින බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දින වන විට වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැවත පදිංචි කිරීම සඳහා හඳුනාගත් පවුල් 189 ක් විය.එයින් විකල්ප ස්ථාන ලබාදී යළි පදිංචි කිරීමට කටයුතු ආරම්භ කර තිබුණේ පවුල් 42 ක් සම්බන්ධයෙන් පමණි. පවුල් 147 ක් තවදුරටත් එම අවදානම් සහිත ස්ථානවලට පදිංචි වී සිටි ඒ අතර, 2014 වර්ෂයේ පළල් පතන වසමේ නායයෑමෙන් ආපදාවට ලක්වූ පවුල් 17 ක්ද විය. | වතු ආශ්‍රිත ඉඩම් අක්කර 20 ක් ඉල්ලුම් කර ඇති අතර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ වතු සමාගම් එකඟතාවය පළ නොකිරීම හේතුවෙන් යලි පදිංචි කිරීමේ කටයුතු ප්‍රමාද වී ඇත. ගම් පුළුල් කිරීමේ ක්‍රමවේදය යටතේ ඉඩම් අත්පත් කර ගැනීමට අදාළ යෝජනාවක් සකස් කරමින් පවතින බව. | ලබා දෙන ප්‍රතිපාදන මඟින් ආපදාවන්ට ලක් වූ මහජනතාවට කඩිනමින් සහන සැලැසීමට කටයුතු කළ යුතු වීම |
| (ඇ) | 2011 පෙබරවාරි 10 දිනැති අංක 2011/1 දරන ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ චක්‍රලේඛය ප්‍රකාරව නායයාම් අවදානම් සහිත දිස්ත්‍රික්කයක් ලෙස හඳුනාගෙන ඇති නුවරඑළිය දිස්ත්‍රික්කයේ කිසිඳු ඉදිකිරීම් කටයුත්තක් වෙනුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ යෝග්‍යතා සහතිකය/නිර්දේශ ලබාගෙන නොතිබූ අතර, කිසිඳු ව්‍යාපෘතියක ගොඩනැගිලි සැලැසුම් පළාත් පාලන ආයතනයෙන් අනුමත කර ගෙන නොතිබුණි. | ගොඩනැඟලි පර්යේෂණ ආයතනය වෙතින් වාර්තා ලබා ගැනීමේදී දැරිය යුතු වියදම් පියවා ගැනීමට ක්‍රමවේදයක් නොමැති වීම ගැටළුවක් වී ඇති බවත් ඉදිරියේදී සියළු ඉදිකිරීම් සඳහා පෙන්වා දී ඇති ආකාරයට කටයුතු කරන බව. | ඉදිකිරීම් සිදු කිරීමේදී සියළු නීතිමය අවශ්‍යතා කෙරෙහි සැලකිලිමත් විය යුතු වීම. |
| (ඇ) | සපිරිගමක් වැඩසටහන යටතේ 2020 වර්ෂයේ රු.1,485,000 ක ගිවිසුම්ගත වටිනාකමකට හඟරාපිටිය සතිපොළ ආර්ථික මධ්‍යස්ථානය ඉදිකර තිබුණි. ව්‍යාපෘතියට අදාළව මි.මි.150 x 65 x 14 හා මි.මි. 100 x 50 x 12 සහිත මි.මි. 2 | මල බැඳීමට ලක්ව තිබූ C –perlin පිරිසිදු කර මල නිවාරණ තීන්ත ආලේප කරන ලෙසට කොන්ත්‍රාත්කරුට | අඩුපාඩු නිවැරදි කර ව්‍යාපෘතිය විධිමත්ව ප්‍රාදේශීය සභාව වෙත පවරා දිය |

| | | | |
|---|---|---|---|
| | සණකමින් යුත් C –perlin සපයා සවිකිරීම සඳහා අවසන් බිල්පතේ විෂය අංක 13 හා 14 යටතේ එකතුව රු.159,784 ක පිරිවැයක් දරා තිබුණි. ව්‍යාපෘතිය නිම කර අදාළ පාර්ශවයන් වෙත භාරදීමටත් ප්‍රථම එම C –perlin අවපැහැ ගැන්වී මලකඩ බැඳීමට ලක්වී තිබුණි. 2021 ජනවාරි 29 දින වන විටත් මෙම ව්‍යාපෘතිය අඹගමුව ප්‍රාදේශීය සභාව වෙත පවරා දීමට හෝ කටයුතු කර නොතිබුණි. | උපදෙස් ලබාදී එම අඩුපාඩු සකස් කර ඇතිබවත් නඩත්තු කාලසීමාවෙන් පසුව ගොඩනැඟිල්ල අදාළ පළාත් පාලන ආයතනය වෙත පවරා දීමට කටයුතු කරන බව. | යුතු වීම. |
| (ඉ) | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ප්‍රකාරව අදාළ තොරතුරු මහජනයාට දැන ගැනීම සඳහා ව්‍යාපෘති ක්ෂේත්‍රයේ ප්‍රදර්ශනය කළ යුතු බවට අවධාරණය කර තිබුණ අතර ඒ පිළිබඳ වගන්තීන් කර්මාන්තය ප්‍රදානය කිරීම් ලිපිවලද ඇතුළත් කර තිබුණි. එහෙත් භෞතිකව පරීක්ෂා කරන ලද උක්ත ව්‍යාපෘතිවලට අදාළව තොරතුරු ප්‍රදර්ශනය කිරීමක් සිදුකර නොතිබුණි. | කර්මාන්තයන් පිළිබඳ විස්තර ප්‍රදර්ශනය කිරීම සඳහා කටයුතු කරන ලෙස කොන්ත්‍රාත්කරුවන්/ සංවර්ධන නිලධාරි වෙත දැනුම් දී ඇතත් සපිරි ගමක් වැඩසටහන තුළ එවැනි නාම පුවරුවක් සඳහා ඇස්තමේන්තුවෙන් මුදල් වෙන්කර දෙන ලෙස උපදෙස් ලබාදී නොමැති බව. | ව්‍යාපෘති පිළිබඳ අත්‍යාවශ්‍ය තොරතුරු මහජනතාවට සන්නිවේදනය කිරීමට වැඩපිළිවෙලක් යෙදිය යුතු වීම. |

## 3.8 අවිධිමත් ගනුදෙනු

--------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------- | ------------ |
| (අ) | කොත්මලේ සහ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ කර්මාන්ත 04 කට අදාළ ව ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු.174,935 ක් ගෙවා තිබුණි. | අධිගෙවීම් අයකිරීමට කටයුතු කරන බව. | අධි ගෙවීම් පිළිබඳව පරීක්ෂා කර බලා මුදල් රෙගුලාසි 156(1) හි සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සපිරි ගමක් වැඩසටහන යටතේ කොත්මලේ, වලපනේ සහ හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල නිමකළ කර්මාන්ත 11 ක් සඳහා රු.632,132 ක අධි ගෙවීම් සිදු කර තිබුණි. | අධිගෙවීම් අයකිරීමට කටයුතු කරන බව . | -එම-. |

**4. තිරසර සංවර්ධනය**

**---------------------**

**තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම**

**----------------------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන අරමුණු පනතේ විධිවිධානයන්ට අනුව 2030 වර්ෂය වන විට ළඟාකරගතයුතු අරමුණු පැහැදිළිව හඳුනාගෙන ඒ අනුව සැලැසුම් සකස් කර නොතිබුණි. | ඒ සම්බන්ධයෙන් සියලුම නිලධාරීන් දැනුවත් කර නියමිත පරිදි කටයුතු කරන බව | පැහැදිළිව තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට අදාළව සැලැසුම් සකස් කළ යුතු වීම. |

**5 යහපාලනය**

**---------------**

**මහජනයා වෙත සේවා ඉටු කිරීම**

**-----------------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නුවරඑළිය දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සේවාලාභි ප්‍රඥප්ති හඳුන්වා දී ක්‍රියාත්මක කළත්, විදුලිය විසන්ධි වන අවස්ථාවලදී ඒ සඳහා බාධාවක් බව නිරීක්ෂණය වේ. විශේෂයෙන් අධික සුළං සහ වැසි සහිත කාලගුණික තත්ත්වයන් පවතින අවස්ථාවල විදුලිය විසන්ධි වීම යථා තත්ත්වයට පත්කිරීම සඳහා අධික කාලයක් වැයවන අවස්ථාවල අත්‍යවශ්‍ය සේවා ඉටුකරවා ගැනීමට පැමිණෙන ජනතාවට මහත් අපහසුතාවයන්ට පත්වීමට සිදුවී තිබුණි. | ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණය මත ප්‍රමුඛතාවය අනුව විදුලි ජනක යන්ත්‍ර ලබාදීමට කටයුතු කරන බව. | ප්‍රමාණවත් ධාරිතාවයෙන් යුතු විදුලි ජනක යන්ත්‍ර සපයාදීම සඳහා අතිරේක ප්‍රතිපාදන ඉල්ලා අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වීම. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්මික නිලධාරීන් තනතුරු 11 න් තනතුරු 10 ක්ම පුරප්පාඩු වී පැවතුණි. ඒ අනුව ව්‍යාපෘතීන් අධීක්ෂණයට ප්‍රමාණවත් කාර්මික නිලධාරීන් සංඛ්‍යාවක් නොසිටීම ගැටළුවක්ව පැවතුණි. | පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්ත කරන ලෙසට ඉල්ලා ඇති බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව, කාර්ය මණ්ඩලයේ සෑම නිලධාරියෙකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලැබෙන පරිදි මානව සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් අඹගමුව,කොත්මලේ සහ නුවරඑළිය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එවැන්නක් පිළියෙල කර නොතිබුණි.එසේම හඟුරන්කෙත සහ නුවරඑළිය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු නිලධාරීන් 473 දෙනෙකු අතුරින් නිලධාරීන් 292 දෙනෙකු සඳහා 2020 වර්ෂය තුළ කිසිඳු පුහුණු අවස්ථාවක් ලබා දී නොතිබුණි. | කොවිඩ් තත්ත්වය මත පසුගිය වර්ෂයේ අදාළ ඉල්ලක්ක ළඟා කර ගැනීමට නොහැකි වුවත්, මෙම වර්ෂයේදී පුහුණුවීම් සිදු කරන බව. | සියළු නිලධාරීන් සඳහා අවම පුහුණු කාල සීමාවක් ආවරණය වන පරිදි පුහුණු අවස්ථා ලබා දිය යුතු වීම. |